# හෙළබසින් මුල් තැන ගත් දිරිය දියණී

ශ්‍රියානි ජයවික්‍රම මද්දුමගේ
ආචාරිනී, මිල්පාක් සිංහල පාසල

පසුගිය දා ඕස්ට්‍රේලියාවේ සංචාරක, සම්පත් හා බලශක්ති අමාත්‍ය මාර්ටින් ෆර්ගසන් මහතා අතින් කැපවීම හා විශේෂ දක්ෂතාවය වෙනුවෙන් වූ සම්මානය හිමි කරගත් ඇයට 2013 පෙබරවාරි 04 දින මෙල්බර්න්හි පැවති නිදහස් සමරු උළෙලේදී දේවිකා රූපසිංහ අනුස්මරණ සම්මානය හිමිකරගත්තාය. අනමින් අසලා නානායක්කාර නම් වූ මෙම යුවතිය පදිංචි වී සිටින්නේ මෙල්බර්න් සිට කි.මී. 300ක පමණ දුරකින් පිහිටි වෝනම්බූල් කියන ප්‍රදේශයේ. වෝනම්බූල් හි



Braver Collage හි 11 වසරේ ඉගෙනුම ලබන ඇයගේ අනාගත බලාපොරොත්තුව නීති උපාධිය හැදෑරීම. මෙල්බර්න්වල උසස් විශ්ව විද්‍යාලයක නීති උපාධිය හදාරන්න නම් VCE විභාගයෙන් ඕස්ට්‍රේලියානු තෘතීයික පාඨමාලා සඳහා ඇතුලත් වීමේ අගය ATAR 98.0ක් ලබාගත යුතු බව ඇය දැන සිටියා. මේ අතර වාරයේ ඇයට දැනගැනීමට ලැබුනා සිංහල භාෂාව විෂයයක් ලෙසට හැදෑරීමෙන් අතිරේක ලකුණු bonus marks ප්‍රමාණයක් ලබාගත හැකි බව. එහෙත් වී.සී.ඊ. විභාගයට සිංහල භාෂාව හදාරන්න ඇය පදිංචි ප්‍රදේශයේ හෝ ඒ අසලකවත් සිංහල පාසලක් තිබුනෙ නැහැ. අවලා මේ පිළිබඳව දැක්වූ උනන්දුව නිසාම ඇගේ මාපියන් තීරණය කලා ඇයට වික්ටෝරියානු භාෂා පාසල් සිංහල භාෂා පාසැලකට ඇතුලත් කරන්නට. 2012 ජනවාරි මාසය ඉඳන් ඇය රොක්ස්බර්ග් පාක් සිංහල පාසැල්වලදී පන්තිය භාර විපුලි ගුණසේකර ගුරුතුමියගේ සිසුවියක් බවට පත්වුණේ ඒ විදියටයි.

එදා පටන් සෑම සෙනසුරාදාවකම පාන්දර 4.00ට නිවසින් පිටත් වන ඇය සිංහල ඉගෙන ගන්න රොක්ස්බර්ග් පාක් සිංහල පාසැලට පැමිණියා. සෙනසුරාදා උදේ පැය 3 කට වැඩි කාලයක් වෝනම්බූල් සිට මෙල්බර්න් වලටත් සවස නැවත පැය 3කට වැඩි කාලයක් මෙල්බර්න් සිට වෝනම්බූල් වලටත් රිය පදවමින් අසලාගේ මෑණියන් දරුවෙකුගේ ඉගෙනීම වෙනුවෙන් මාපියනට කලහැකි උපරිම කැපකිරීම තම දියණිය වෙනුවෙන් කරනු ලැබුවා. මේ තරම් දුරක සිට සිංහල ඉගෙන ගන්න පැමිණි අසලා කෙදිනකවත් පන්තියට ප්‍රමාණ වී නොපැමිණි බවයි ඇගේ සිංහල ගුරුතුමිය සඳහන් කළේ.

2012 වසරේ VCE විභාගයට පෙනී සිටි අසලා ලකුණු 40 ක් (Raw Marks) ලබාගෙන වික්ටෝරියා ප්‍රාන්තයේ  සිංහල භාෂාවට ඉහළම ලකුණු ලබා ගැනීමට සමත් වුනේ තම උත්සාහයත් කැපවීමේත් ප්‍රතිඵල උපරිම ලෙස අත් විඳිමිනුයි. 2012 වසරේ සිංහල භාෂා විෂයට අතිරේක ලකුණු ඊදබම් ඒරනි 7ක් එකතු වන බැවින් ප්‍රමිතිකරණයෙන් ජ්කසබට පසුව ඇයගේ ප්‍රමුක ලකුණු ජ්කැා මව 47 දක්වා ඉහල යනවා. එය ඇයගේ අනාගත අපේක්ෂාව වන නීති උපාධිය හැදෑරීම සඳහා අවශ්‍ය වන ඉහල ATAR අගයක් ලබා ගැනීමට ඉමහත් රුකුලක් වෙනවා.

සිංහල භාෂාවට ඉහලම ලකුණු ලබාගත හැක්කේ ලංකාවේ ඉහල පන්ති දක්වා සිංහල ඉගෙන ගෙන ඕස්ට්‍රේලියාවට පැමිණි දරුවන්ට පමණකැයි සමහරුන් දරන ආකල්පය නිවැරදි නොවන බව ද මෙම දිරිය දියණිය අපට පෙන්වා දී තිබෙනවා. ලංකාවේ මියුසියස් විදුහලේ 06 වසර දක්වා අධ්‍යාපනය ලැබූ අසලා ඕස්ට්‍රේලියාවේ පදිංචියට පැමිණ ඇත්තේ 2008 වසරේදීයි.

මියුසියස් විදුහලේ 3 වසර දක්වා සිංහල මාධ්‍යයෙන්ද 4, 5 වසර දෙක ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද 6 වසර නැවත සිංහල මාධ්‍යයෙන් ද ඉගනුම ලැබූ අවලා 06 වසරේදී සිය මාපියන් සමග ඕස්ට්‍රේලියාවේ පදිංචියට පැමිණියා. ඕස්ට්‍රේලියාවට පැමිණි අසලාට 2012 වසර වක්වා එනම් වසර 4ක්ම සිංහල ඉගැනීමට අවස්ථාවක් ලැබුනේ නැහැ. ඇය පදිංචි වෝනම්බුල් ප්‍රදේශයේ වෙසෙන සිංහල පවුල් සංඛ්‍යවද ඉතා සීමිතයි. මෙවන් පරිසරයක වෙසෙන අවලා එක් වසරක විධිමත් සිංහල අධ්‍යාපනයකින් පසුව මෙවන් උසස් ප්‍රතිඵලයක් ලබාගැනීම බෙහෙවින්ම අගය කළ යුතු තත්වයක්. ඇගේ මේ ජයග්‍රහනයට ඇගේ මාපියන් දෙපලගේ මෙන්ම ඇගේ පන්ති භාර විපුලි ගුණසේකර මහත්මියගේ කැපවීමද මහඟු අත්වැලක් වූ බව සඳහන් කල යුතුමයි.

සිංහල භාෂාව ඉගෙනීමටත් වසර 4ක් දුරස් වීමෙන් අනතුරුව එක් වසරක කාලයක් තුල තම සිංහල දැනුම දියුණු කරගත්තේ කෙසේද යන්න මා අසලාගෙන් විමසූවිට ඇගේ පිළිතුර වූයේ සතිපතා සිංහල පුවත්පත (ලක්බිම) ලබාගෙන කියවීමෙන් කාලසටහනට අනුව සිංහල විෂයයට කාලයක් වෙන් කරගෙන පාඩම් කටයුතු කිරීමෙන් ඇගේ දැණුම දියුණු කර ගැනීමට මහත් සේ ඉවහල් වූ බවයි. ඇය නිවසේදී කතා කලේ සිංහල භාෂාවෙන්. සිංහල භාෂාව හැදෑරීම සඳහා ඇයට සිය පාසලෙන් සතියකට පැය 5ක කාලයක් ලබා දී තිබුණා ඒ කාලය ඇය සිංහල දැනුම දියුණු කර ගැනීමට යෙදවූවා. විභාගයට සූදානම් වීමේදී 2002 වසරේ සිට පසුගිය විභාග ප්‍රශ්ණ පත්‍ර අධ්‍යනය කල ඇය තොරෙතුරු සොයා ගැනීම සඳහා අන්තර්ජාලය යොදා ගත්තා. සිංහල ගුරුතුමිය පැවැත්වූ අතිරේක පන්ති සියල්ලටම ඇය සහභාගි වුනා. ඕකෘ විභාගයේ වාචික පරීක්ෂණය සඳහා ඇය තෝරගත්තේ කලාව හා රසවින්දනය යන මාතෘකාව යටතේ වත්මන් සංගීතය යන මාතෘකාවයි. ඇය සිංහල පාසැලේ 11 වසරේ සිසුවියන් සඳහා මගපෙන්වන්නියක් monitor වශයෙන් ද කටයුතු කලා. ඇගේ සිංහල ගුරුතුමිය ඇයට හැඳින්වූයේ කලට වේලාවට වැඩ කරන ඉදිරිපත් වීමේ හැකියාව ඇති, ධෛර්යමත් ශිෂ්‍යයෙක් ලෙසටයි.

දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවක් ඉගෙනීමේ වටිනාකම දෙමාපියන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත්. ඕකෘ විභාගයට පෙනී සිටින දරු දැරියනට උසස් පාඨමාලා සඳහා ඇතුලත් වීමට ඉහල ්ඕසෘ අගයක් ලබා ගැනීම අවශ්‍ය වනවා. යම් සිසුවකු විෂයයක් සඳහා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය සෘඅ ඒරනි විශ්ව විද්‍යාලයට ඇතුලත් කර ගැනීමේ අවශ්‍යතාවය සඳහා ප්‍රමිතිකරණයට  scaled up or down ලක් කෙරෙනවා. එසේ කිරීමෙන් අධ්‍යාපනයට ලැබෙන ප්‍රමුක ලකුන තමයි ATAR අගය ගණනය කිරීම සඳහා යොදා ගන්නේ. ඒ ඒ විෂය ප්‍රමුකකරණයට යොදාගන්නා ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ සෑම වසරකම ඒ ඒ විෂයයන් ලබා ගන්නා සාපේක්ෂ ප්‍රගතියට අනුවයි. එනම් සිසුන් එම විෂය හැදෑරීම සඳහා කෙතරම් උත්සාහයක් ගනු ලැබ තිබීද යන්න මෙහිදී සැලකිල්ලට ගනු ලබනවා.

ඉංග්‍රීසිසමග. වෙනත් භාෂා අධ්‍යාපනය බධඹෑ දියුණු කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව වෙනත් භාෂා අධ්‍යනය සඳහා අමතර ලකුණු Bonus marks 05ක් ලබා දීමට රජය තීරණයක් ගෙන තිබෙනවා. ඒ අනුව ඕකෘ විභාගය සඳහා සිංහල විභාගයට පෙනී සිටින සිසුන්ට එම අමතර ලකුණු ලබා ගැනීමේ වාසිය හිමි වනවා. එක් එක් වසරේ දී මෙසේ එකතු වන අමතර ලකුණු ප්‍රමාණය වෙනස් වෙනවා. 2012 වසරේදී සිංහල භාෂාව සඳහා අතිරේක ලකුණු 07 ක් ලබා දී තිබෙනවා. 2011 වසරේදී සිංහල භාෂාව සඳහා අතිරේක ලකුණු 09ක් ලැබී තිබුණා. මේ අනුව සිංහල පරිසරයක හැදී වැඩෙන අපේ දරුවන්ට ඕකෘ විභාගය සඳහා සිංහල භාෂාව තෝරා ගැනීමෙන් වෙනත් විෂයක් ඉගෙනීම සඳහා වැය කරන කාලයට වඩා අඩු කාලයකින් ලකුණු ලබා ගැනීමේ ඉඩකඩක් තිබෙනවා.

වික්ටෝරියානු භාෂා පාසල් දැනට මධ්‍යස්ථාන 05ත සිංහල භාෂාව ඉගැන්වීම කෙරෙනවා.

මෙල්බර්න් හි උතුරු ප්‍රදේශයේ රොක්ස්බර්ග් පාක් හා මිල්පාක් යන පාසල්වල ඕකෘ දක්වා සිංහල ඉගෙනීඹට අවශ්‍ය පහසුකම් තිබෙනවා. කුඩා දරුවන්  වරදව මට්ටමේ දීම සිංහල පාසලට ඇතුලත් කරගත හැකියි. සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට 12.20 දක්වා පන්ති පැවැත්වෙනවා.

මේ වසරේදී Bright හා Horsham යන ප්‍රදේශ වල සිංහල සිසුන්ට රොක්ස්බර්ග් පාක් මධ්‍යස්ථානය හා video Conferencing මගින් සම්බන්ධ වී සිංහල ඉගැනීමට අවස්ථාව ලබා දීම වික්ටෝරියානු භාෂා පාසැලේ තවත් එක් කඩඉමක් බව සඳහන් කල යුතුයි. දුර බැහැ ප්‍රදේශවල සිටින සිංහල දරුවන් වැඩි සංඛ්‍යාවක් සිංහල ඉගෙනීමට උනන්දුවක් දක්වන්නේ නම් එය විධිමත් දුරස්ථ අධ්‍යාපන මට්ටම දක්වා දියුණු කිරීමටද දැන් අවස්ථාව උදාවී තිබෙනවා.

විදෙස් රටක විසුවද තම හෙල බසට ආදරය කරමින් ඒ වෙනුවෙන් බොහෝ සේ කැපවීම් කොට එහි ඵල නෙලාගත් අවලා දියණියගේ ඉදිරි ගමනට ඇය ලැබූ මේ ජයග්‍රහනය ආලෝකයක්ම වේවා.

**Study Sinhala**

Year 1-12

Victorian School of Languages

Saturdays 9.00 am-12.20 pm

**Centres**

Roxburgh College
Donald Cameron Drive
Roxburgh Park

Mill Park Secondary College
Moorhead Drive
Mill Park

**Enrolments now open for 2013**

**Enrol online**
www.vsl.vic.edu.au

or

**Contact**

Himalee Karunasena
Roxburgh Park Centre
0409077420

Sriyani Maddumage
Mill Park Centre
0432077038

ProSmile
Dental Surgery

General and Cosmetic Dentistry

Dr Anne Perera (BDSc)

2A Montasell Avenue
Deer Park Vic 2023

Telephone: (03) 8390 4055

Clinic Hours: Monday - Friday
9:00am - 5:00pm